# 4 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - පැවරුම 1

පහත පාඩම් වලින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.( අභ්‍යාස පොතේ ලියන්න.)

1. **සිදුහත් කුමරු සතර පෙර නිමිති දැකීම.**

    1. සිදුහත් කුමරු උයන් කෙළියට ගියේ කවුරුන් සමඟද?
    2. සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති පිළිවලින් ලියන්න.
    3. සිදුහත් කුමරු උයන් කෙළියට ගොස් අතරමගදී හැරී මාලිගාවට පැමිණි දින මොනවාද?
    4. එසේ ආපසු පැමිණි පැමිණීමට හේතු ලියන්න.
    5. සිදුහත් කුමරු හතරවන දිනයේදී උයන් කෙළියට ගොස් සතුටු වීමට හේතුව කුමක්ද?
    6. සිව්වැනි දිනයේ දී දුටු පැවිදි රුව පිළිබඳව ඡන්න සිදුහත් කුමරුට හඳුන්වා දුන් පසු සිදුහත් කුමරු පැවසූ දේ ලියන්න.
    7. පාඩමේ ක්‍රියාකාරකම් කරන්න.

2. **කුමරු ගිහිගෙය හැර යයි.**

    1. උයන් සිරි නරඹමින් සිටි සිදුහත් කුමරුට පණිවුඩයක් රැගෙන රජ මැඳුරෙන් පැමිණියේ කවුද? එම පණිවිඩය ලියන්න.
    2. එම පුවත ඇසූ පසු සිදුහත් කුමරු ගේ මුවින් පිටවූ වචනය ලියන්න.
    3. මාලිගාවට පැමිණෙන සිදුහත් කුමරුගේ මුවෙහි ප්‍රසන්න භාවය දුටු කිසා ගෝතමිය කිවූ නිබ්බුත පද හා එහි තේරුම ලියන්න.
    4. එදින රාත්‍රියේ නාටිකාංගනාවෝ නැටුම නවතා නිදා ගැනීමට හේතුව ලියන්න.
    5. ඡන්න ඇමැති සමඟ කන්ථක අසුපිටින් ගිහිගෙය හැර යාම හඳුන්වන නම ලියන්න.
    6. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් ලියන්න.

3. **පැවිදි වූ බෝසතාණෝ සත්‍ය සොයා යති.**

පාඩම කියවා අසා ඇති ප්‍රශ්න වලට හරිනම් හරි ලකුණු ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න.

1. සිදුහත් කුමරු ඝටීකාර නම් බ්‍රහ්මයා විසින් ලබාදුන් සිවුරු හැඳ පැවිදි වෙස් ගත්තේ ය. ☐
2. කන්ථක අසු සමග ඡන්න ඇමති ආපසු මාළිගයට පැමිණියහ. ☐
3. සිදුහත් තාපසතුමා අනුපිය අඹ වනයෙහි සතියක් කල් ගෙවීය. ☐
4. සිදුහත් කුමරු ගිහිගෙය හැරගියේ ඇසල පොහොය දිනකය. ☐
5. සිදුහත් කුමරුට හමු වූ මුල්ම ගුරුවරයා උද්දකරාම පුත්ත ය. ☐
6. සිදුහත් බෝසතාණන්ට හමුවූ ගුරුවරුන්ගෙන් දැනුම ලබාගැනීමට බොහෝ කලක් ගත විය. ☐
7. සිදුහත් බෝසතාණන්ට හමුවූ ගුරුවරුන් ගණන හතරකි. ☐
8. සිදුහත් කුමරු කෙස් වැටිය කපා දැමූයේ නෙරන්ජනා ගඟ අසල දී ය. ☐
9. සිදුහත් කුමරු යසෝදරා දේවිය සමඟ කතා නොකර ගිහිගෙය හැර ගියේය. ☐
10. සිදුහත් බෝසත් තුමා සත්‍යය සොයා මහත් වෙහෙසක් ගෙන තවුස්දම් පුරන්නට විය. ☐

4. **බෝසතාණෝ බුදු බවට පත්වෙති.**

1. බුදුරජාණන් වහන්සේගේ  රැස් විහිදෙන පින්තූරයක් අඳින්න.
2. බෝසතාණන් වහන්සේ තවුස්දම් පුරන සමයේ උන්වහන්සේ අසල සිටි තාපස වරුන්ගේ නම් ලියන්න.
3. තාපසවරුන් බෝසතාණන් වහන්සේට උදව් කිරීමට හේතුව කුමක්ද?
4. පිඬු සිඟා වැඩීම නතර කළ  බෝසතාණන් දනය සපයා ගත්තේ කෙසේද?
5. සිදුහත් බෝසතාණන්ට කිරිපිඩු දනය පූජා කළේ කවුරුන් විසින්ද?
6. බුදුරජාණන් වහන්සේ උපදවාගත් ත්‍රිවිද්‍යා නම් කරන්න.

5. **බුදු සමිඳුගේ පිහිට ලැබූ පූතිගත්තතිස්ස  තෙරිඳු.**

1. පාඩමේ සඳහන් කවි පාඩම් කරන්න. ලියන්න.
2. අවසානයේ තිස්ස තෙරුන් වහන්සේට සිදු වූ දෙය කෙටියෙන් ලියන්න.
3. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම කරන්න.
4. පුහුණුවට ලබාදී ඇති ලෝවැඩ සඟරාවේ කවි පාඩම් කරන්න.

6. **බුදුහාමුදුරුවෝ කිසාගෝතමියට පිහිට වෙති.**

1. කිසා ගෝතමිය බුදුරජාණන් වහන්සේ වෙත පැමින කියූ වගන්තිය ලියන්න.
2. බුදුරජාණන් වහන්සේ කිසාගෝතමියට කළ දේශනය ලියන්න.
3. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් කරන්න.

7. **බෝසත් දරුවෝ.**

1. පන්සල් රැගෙන යාමට අත්තම්මා සූදනම් කළේ මොනවාද?
2. පන්සල් ගොස් මුලින්ම ඔවුන් කළ දේවල් තුනක් ලියන්න.
3. අම්මාට හා තාත්තාට වඳින ගාථා ලියන්න.
4. බෝසත් දරුවන් තුළ තිබිය යුතු ගති ගුණ හාමුදුරුවෝ විස්තර කළ දේවල් ලියන්න.
5. පාඩමේ ක්‍රියාකාරකම කරන්න

8. **යහගුණ දම් වඩමු.**

1. පොඩි හාමුදුරුවෝ රැගෙන පැමිණි අත් පත්‍රිකා වල තිබුණු දේවල් මොනවාද?
2. අප විසින් අනුගමනය කළ යුතු ආහාර පුරුදු හතරක් ලියන්න.
3. බෞද්ධ දරුවෙකුට උපන්දිනයට කළ හැකිවේ පින්කම් තුනක් ලියන්න.
4. පාඩමේ පැවරුම කරන්න.

9. **නීරෝගීමත් හෙට දවසක්.**

1. උදෑසන ආහාර සඳහා අපට ගත හැකි දේවල් මොනවාද?
2. දිනෙත් පාසල් ගොස් පැමිණි පසු කරන දේවල් මොනවාද?
3. දිනෙත් දිවා ආහාර ගැනීමෙන් පසු කරන්නේ මොනවා ද?
4. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් කරන්න.

10. **මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය.**

1. මහා ප්‍රජාපතී ගෝතමිය හැදින් වූ වෙනත් නමක් ලියන්න.
2. මහා ප්‍රජාපතී ගෝතමිය පැවිදි වීමට පැමිණියේ තවත් කාන්තාවන් කී දෙනෙක් සමඟ ද?
3. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් කරන්න.

11. **අග්‍ර ශාවකයන් වහන්සේලා.**

1. අග්‍ර ශ්‍රාවකයන් දෙනමගේ නම් ලියන්න.
2. ඔවුන් දෙදෙනා පැවිදි විමට පෙර නම් මොනවා ද?
3. අස්සජි හිමියන් හමුවූයේ කාට ද?
4. අස්සජි හිමියන් දේශනා කළ ගාථාව ලියන්න.
5. පාඩමේ ක්‍රියාකාරකම ලියන්න.

12. **අපූරු මිතුදම.**

1. මෙම පාඩමේ සිටින මිතුරන් තිදෙනා කවුද?
2. මෙම පාඩමේ සදහන් ජාතක කතාවේ නම ලියන්න.
3. ඉබ්බා කළ උදව්වට මුවා කළගුණ සැලකූ ආකාරය ලියන්න.
4. පාඩමේ ක්‍රියාකාරකම් කරන්න.

13. **වැඩිහිටි උපස්ථානය.**

1. වැඩිහිටියන්ට සැලකීමේ වැදගත්කම සඳහන් වන ජාතික දෙකක් ලියන්න.
2. අම්මා අපට කරන උපකාර දෙකක් ලියන්න.
3. තාත්තා අපව ලොකුමහත් කිරීමට කරන දේවල් මොනවාද?
4. දෙමාපියන්, වැඩිහිටියන් අපට කරන උපකාරවලට විසින් කළ යුතු දෙය කුමක්ද?
5. පාඩමේ ක්‍රියාකාරකමෙහි සඳහන් කවි පාඩම් කරන්න.

14. **බොදු බැති ගී.**

1. පාඩමේ සඳහන් ගීතය පාඩම් කරන්න.
2. ගීතයේ සඳහන් ආකාරයට බුදුහාමුදුරුවෝ දකින්නට අප යන්න එන්න ඇති පන්සල කුමක්ද?
3. බුදුහාමුදුරුවෝ දැක බණ ඇසූ නමුත් නිවන් දකින්නට මදි වුවා යැයි කියන්නේ මොනවාද?
4. අප පින් පුරවා බලාපොරොත්තු විය යුත්තේ කුමක්ද?
5. මෙම ගීතය ලියා ඇත්තේ කවුරුන්ද?

15. **අපි පරිසරය සුන්දර කරමු.**

1. පාඩමේ සඳහන් ආකාරයට බිත්ති පුවත් පතෙහි පළ කර තිබූ මාතෘකා මොනවාද?
2. පාඩමේ සදහන් ආකාරයට සත්තුන්ට ආහාර දීමට සකස් කළ යුතු දේ කුමක්ද?
3. අසරණ පුද්ගලයන්ට ජලය ලබා ගැනීමට  සකස් කළ යුතු දේ කුමක්ද?
4. පරිසරය අලංකාර කිරීමට අපට කළ හැකි දේවල් ගැන ලියන්න.
5. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් කරන්න.

16. **අප පාසලේ පිරිත් පිංකම.**

1. අලංකාරවත් පිරිත් මණ්ඩපයක් අඳින්න.
2. පිරිත් මණ්ඩපය සෑදීමට ගන්නා දේවල් මොනවාද?
3. පිරිත් මණ්ඩපයේ තබා ඇති මේසයේ තැබූ විශේෂ දෙය කුමක්ද?
4. පිරිත් දේශනයට ආරාධනා කරන්නේ කෙසේද?
5. පාඩමේ සදහන් ක්‍රියාකාරකම් කරන්න.

17. **දන්දෙමු පින් පුරමු.**

1. ළමා නිවාසයේ ළමුන්ට දීමට හැකි දේවල් මොනවාද?
2. යසිරු ගේ පන්තියේ ළමයි ළමා නිවාසයට ගොස් කළ දේවල් දෙකක් ලියන්න.
3. යසිරු ගේ තාත්තා මේ පින්කම ගැන අසා කළ යෝජනාව කුමක්ද?
4. පාඩමේ සඳහන් ක්‍රියාකාරකම් කරන්න.

18. **මෙත් හැගුමෙන්  සිත් පුරවමු.**

1. ඇඳුම් පැළඳුම් පිරිසුදු කර ගන්නේ මොනවා භාවිත කිරීමෙන් ද?
2. අපගේ සිත පිරිසිදු කර ගන්නේ කුමක් කිරීමෙන්ද?
3. භාවනාව කිරීමට සූදනම් වන ආකාරය කුමක්ද?
4. පාඩමේ සඳහන් ආකාරයට භාවනාව කරන විට කරන දේ  කියා ලියන්න.
5. දිනපතා භාවනා කිරීමට පුරුදු වන්න.

19. **ශ්‍රමය දීම දනයක්.**

1. ත්‍රිවිධ පුන්‍ය ක්‍රියා නම් කරන්න.
2. ශ්‍රමදනය යනු කුමක්ද?
3. නිපුන් දහම් පාසලෙන් ගොස් වැඩිහිටි නිවාසයේ කළ ශ්‍රමදනය කෙටියෙන් ලියන්න.
4. අපගේ පාසල් වත්තේ ශ්‍රමදනයක් කිරීමට නම් අප කළයුතු දේවල් ලැයිස්තුවක් සකස් කරන්න.
5. පාඩමේ ක්‍රියාකාරකම් කරන්න.

20. **සිල් සුවඳ පතුරවමු.**

1. පාඩමේ සදහන් ආකාරයට පාසලේ සූදනම් කර තිබූ පොහොය වැඩසටහනේ සඳහන් දේවල් තුනක් ලියන්න.
2. වෙසක් සැරසිලි සඳහා භාවිතා නොකළ යුතු දෙයක් ගුරුතුමිය විසින් පෙන්වා දුන්නාය එය කුමක්ද?
3. සිල් ඉල්ලීමේ වාක්‍ය ලියන්න. පාඩම් කරන්න.
4. පාඩමේ සඳහන්වන ජාතක කතාව ලියන්න.
5. පාඩමේ ක්‍රියාකාරකම කරන්න.

---

- *ඉහත පැවරුම් සිදුකර පාසල පවත්වන විට පාසලට රැගෙන එන්න.*
- *මේ වසංගත රෝගය අවසන්වනතුරු නිවසට වී සිටින්න.*
- *දිනකට පැය හතරක් පාඩම් වැඩ කරන්න.*